<u>**රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව**</u>

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------

ප්‍රමිත අංක 18 අනුව මෙහෙයුම් කටයුතු සඳහා තවදුරටත් භාවිතා වන සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කළ යුතු වුවත් 2010 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති එහෙත් තවදුරටත් භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබණි.

1.2.2 **ගණකාධිකරණ අඩුපාඩු**

---------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **ගිණුම්වලින් අත්හැරීම්**

-------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ආ) **අනුචිත හෙළිදරව් කිරීම්**

-------------------------

(1) විකුණුම් ආදායම් රැස් කිරීමේදී විකුණුම් රැස් කිරීමේ ගිණුම විකුණුම් පාලන ගිණුම හා සැසඳීම් කර නිරවුල් කර ගත යුතු වුවත් එසේ කර

නොගෙන සමාලෝචිත වර්ෂයේදී සැසඳීම් නොකළ හර ශේෂ දෙකක එකතුව වූ රු.435,732 ක් බැර ශේෂ දෙකක එකතුව වූ රු. 1,387,730 ට හිලවු කර රු.951,998 ක බැර ශේෂයක් ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ ඍණ ශේෂයක් වශයෙන් පෙන්වා තිබුණි.

(11) කාර්ය මණ්ඩල ණය යටතේ හර ශේෂ වටිනාකම රු.347,173 ක් වූ අතර, ඉන් බැර ශේෂ වටිනාකම වූ රු. 16,368 ක් අඩුකිරීමෙන් පසු වෙනස වූ රු. 330,805 ගිණුම්වල දක්වා තිබුණි. කාර්ය මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල් හා අයවිය යුතු මුදල් ඇති අවස්ථාවල ඒවා නිරවුල් කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකසා නොතිබීම මීට හේතු වී තිබුණි.

### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද තොග විචලතා ගිණුමේ රු.99,099 ක් වූ ශේෂය 2010 දෙසැම්බර් 31 දිනටද සැසඳීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට සැසඳීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු තොග විචලතා ගිණුමේ ශේෂය රු. 126,652 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු. 39,641,361 ක් වූ ණය හිමියන්ට අදාළ කාල විශ්ලේෂණයට අනුව වසර 5 ක් ඉක්මවන ලද ණය හිමියන්ගේ වටිනාකම රු. 18,848,493 ක් වූ අතර, එය මුලු ණය හිමියන්ගෙන් 47.5 % ක් විය.

(ආ) ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව නිරවුල් නොකල අත්තිකාරම් රු. 4,891,182 ක් වූ අතර, ශේෂ පත්‍රයේ රු. 4,859,433 ක් ලෙස ණය හිමියන්ගේ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. උපලේඛනයේ හා ශේෂ පත්‍රයේ සඳහන් වටිනාකම අතර වෙනස රු. 31,749 ක් විය.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අත්තිකාරම් රු. 4,891,182 ක් වූ අතර ඉන් රු. 2,549,263 ක් වර්ෂ දෙකකට පෙර ලබා දී ඇති අත්තිකාරම් වේ.

**1.2.5 නීති,රීති රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) මුදල් පනතේ 13 (8) උප වගන්තියේ ඒ සහ බී ඡේද | 2009 වර්ෂයේ 13 (7) (ඒ) වාර්තාව සඳහා පාලක මණ්ඩලය විසින් ගැනීමට යෝජිත පියවර සම්බන්ධයෙන් විගණකාධිපතිට දන්වා නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| ( i) මු.රෙ.177(1) | ආයතනයට ලැබෙන සියලු මුදල් බැංකුවේ තැන්පත් කොට කුවිතාන්සි ලබා ගත යුතු වුවද එසේ කටයුතු නොකොට රුපියල් ලක්ෂය ඉක්මවන මුදල් ප්‍රමාණ දින 03 සිට දින 21 දක්වා කාලයන්හි මුදල් භාරකරු අත රඳවා ගෙන තිබුණි. |
| (ii) මු.රෙ.315,316,317 | සුලු මුදල් භාරකරු භාරයේ ඇති රු.100,000 ක සුලු මුදල් අග්‍රිමයට අමතරව ලැබෙන සියලු මුදල් ආරක්ෂා සහිතව සේප්පුවක තැන්පත් කර නොතිබුණු අතර, සාමාන්‍යයෙන් රු.150,000 ක පමණ වු මුදල් , මුදල් භාරකරුගේ මේසයෙහි ලාච්චුවක තබා ගෙන තිබුණි. |
| (ඇ) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත 7(2)(ආ) වගන්තිය | එකතු කළ අගය මත අය කරනු ලබන බදු මුදල් ඊලග මාසයේ පළමුවන සතිය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් 2010 වර්ෂයට අදාළ රු. 725,263 ක්ද, 2009 වර්ෂයට අදාළ රු. 2,078,804 ක්ද, 2008 වර්ෂයට අදාළ රු. 1,879,188 ක්ද සංස්ථාවේ රඳවා ගෙන තිබුණි. සභාපතිවරයාගේ 2011 මැයි 13 දිනැති ලිපියෙන් රු.මිලියන 12 ක බදු බැරට හිලවු කිරීමේ අදහසින් මෙම මුදල් රඳවා ගන්නා ලද බව දැනුම් දී තබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 92,128,005 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී බදු පූර්ව ශුද්ධ ලාභය රු.17,493,407 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.74,634,598 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ප්‍රධාන මුද්‍රණාලයේ රු.85,936,934 කින්ද, ලිපි ද්‍රව්‍ය ගබඩාවේ රු. 16,575,847 කිනද, අනෙකුත් විකුණුම් ඒකක වලින් රු. 1,469,428 කින් ද සමාලෝචිත වර්ෂයේ දළ ලාභය වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය වැඩිවීම රු.74,634,598 ක් වුවද, ණය ගැති වටිනාකම වැඩිවීම රු.261,528,029 ක් විය.ඒ අනුව විකුණුම් ආදායම තුළ අන්තර් ගත ණයට විකුණුම් ප්‍රමාණාත්මක වශයෙන් ඉහළ අගයක් ගෙන ඇත.

### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව පසුගිය වර්ෂයේ ශේෂය වූ රු.9,337,551 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 40,484,817 ක අයිරා ශේෂයක් විය.ඒ අනුව රු.49,822,368 කින් ශේෂය පිරිහීමක් නිරීක්ෂණය විය.

මහජන බැංකුව ජාත්‍යන්තර ශාඛාවේ බැංකු අයිරා ශේෂය 2010 වර්ෂයේදී 2009 වර්ෂයට වඩා රු.30,528,542 කින් වර්ධනය වී තිබුණු අතර, මහජන බැංකුව හෝමාගම ශාඛාවේ රු.5,053,033 ක අයිරාවක් ඇති වී තිබුණි. සංස්ථාවේ විකුණුම් විශාල ප්‍රමාණයක් ණයට සිදු කර තිබීමත් , ණය අයකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් ක්‍රියා මාර්ග සිදු නොකිරීමත් , නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ණයට ගැනීමත් මෙසේ බැංකු අයිරාව වර්ධනයට හේතු වී තිබුණි. ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග අනුගමනය නොකිරීම නිසා බැංකු අයිරා ගෙවීමේ හැකියාව දුර්වල තත්ත්වයක පවතී.

### 2.1.3 ණය උපයෝජනය

--------------------

**බැංකු ණය ප්‍රමාණයේ වර්ධනය**

------------------------------------

නිෂ්පාදන අවශ්‍යතා සඳහා අමු ද්‍රව්‍ය සහ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා සංස්ථාව ලබා ගෙන තිබූ කෙටි කාලීන බැංකු ණය මැත කාලීනව වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. 2010 වර්ෂයේදී රු. 452,664,894 ක්ද, 2009 වර්ෂයේදී රු. 340,754,716 ක්ද, 2008 වර්ෂයේදී රු. 249,430,332 ක්ද වශයෙන් ණය ලබා ගෙන තිබුණි. මේ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී ලබා ගත් ණය වල වටිනාකමට 32% කින්ද, 2008 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී ලබා ගත් ණය වටිනාකම 81 % කින්ද වර්ධනය වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

**(1) විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2003 ජුනි 02 දිනැති අංක: පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 උප වගන්තියට අනුව අවම වශයෙන් මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2010 වර්ෂයට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

**(11) කාර්ය මණ්ඩල පිරිවැය**

------------------------

ආයතනයේ සේවකයින් 08 දෙනෙකු අමාත්‍යාංශයට හා බස්නාහිර පළාත් සභාවට මුදා හැර තිබුණු අතර,ඉන් සේවකයින් 05 දෙනෙකු සඳහා 2010 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.667,600 ක් ගෙවා තිබුණි.

**(111) සෙමින් චලනය වන තොග**

-----------------------------

GSM 60 කඩදාසියේ පොත් නිෂ්පාදනය ආරම්භ වීමත් සමග GSM 58 කඩදාසියෙන් නිෂ්පාදිත පොත් සඳහා පැවති ඉල්ලුම අඩු වීම හේතුවෙන් 2008 වර්ෂයට පෙර සිට එක් රැස් වෙමින් පැවති GSM 58 කඩදාසියේ නිෂ්පාදනය කරන

ලද විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් අභ්‍යාස පොත් 376,514 ක් පමණ ගබඩාවේ ගොඩ ගසා තිබුණි. ඒවා දූවිලි බැඳී දුර්වර්ණ වී ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබියදී 2010 වර්ෂයේදීද GSM 58 කඩදාසියෙන් අභ්‍යාපොත් නිෂ්පාදනය කර තිබුණි.

(iv) **වෙළඳපළ තරගකාරීත්වයට මුහුණ දීමේ දුර්වලතා**

---

වෙනත් පෞද්ගලික ආයතන නිෂ්පාදනය කරනු ලබන GSM 56 කඩදාසියේ නිෂ්පාදිත අභ්‍යාස පොත් වලට වඩා හොඳ ඉල්ලුමක් පවතින බව වෙළඳ පොළ නිරීක්ෂණයේදී සනාථ වන අතර, GSM 56 කඩදාසියේ නිෂ්පාදිත අභ්‍යාස පොත් සඳහා වෙළඳපළ නිර්මාණය කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(v) **ප්‍රමිතියට අනුකූල නොවන පොත් නිෂ්පාදනය**

---

පොත්වල ඇමුණුම් කටු මල කෑම සහ ඇතැම් පොත් නැවත ඇමුණුම් කටු සවි කිරීම නිසා පලුදු වී තිබීම වැනි හේතු නිසා පාසල් වලින් හා අලෙවිසල් වලින් ආපසු එවන ලද පොත් 13500 කට ආසන්න ප්‍රමාණයක් ගබඩාව තුළ තැන්පත් කර තිබුණි. මෙසේ නිෂ්පාදන ප්‍රමිතිය පිළිබඳ අවධානය යොමු නොකොට තත්ත්වයෙන් බාල නිෂ්පාදනයන් වෙළඳපළට ඉදිරිපත් කිරීම තුළින් සංස්ථාවේ කීර්ති නාමය දීර්ඝකාලීනව පාරිභෝගිකයාගේ අප්‍රසාදයට පත් වීමත් ඒ තුළින් සංස්ථාවේ නිෂ්පාදන වලට ඇති ඉල්ලුම බිඳවැටීම නොවැළැක්විය හැකි කරුණක් බවත් නිරීක්ෂණය විය.

(vi) **පාසල් පෙළ පොත් මුද්‍රණ ඇණවුම**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

( අ ) 2011 වර්ෂය සඳහා සමස්ථ පාසල් පෙළ පොත් මුද්‍රණය පොත් වර්ග 387 ක් වූ අතර, ඉන් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට ලැබී තිබුණු පොත් වර්ග ප්‍රමාණය පොත් වර්ග 133 ක් විය. එය සමස්ථ මුද්‍රණයෙන් 34.37% ක් වූ අතර, පසුගිය වර්ෂ දෙක හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට ලැබී ඇති පොත් වර්ග සංඛ්‍යාව

වැඩි වී තිබුණද පිටපත් සංඛ්‍යාවේ විශාල වර්ධනයක් සිදු වී නොතිබුණි.

(ආ) පාසල් පෙළ පොත් මුද්‍රණ ඇණවුම ප්‍රදානය කිරීමේදී පසුගිය වර්ෂයේ පෙළ පොත් නියමිත දිනට මුද්‍රණය කර භාර දීම පිළිබඳව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සලකා බලනු ලබයි. එහෙත් 2011 වර්ෂය වෙනුවෙන් 2010 වර්ෂයේදීද මුද්‍රණය සඳහා ලබා දුන් පොත් ගිවිසුමේ සඳහන් දිනට භාර දිමට නොහැකි වී තිබුණි. 2008 වර්ෂයේදී ඉන්වොයිස් වටිනාකමින් 11.5% ක් වූ රු.75,122,382 ක්ද 2009 වර්ෂයේදි ඉන්වොයිස් වටිනාකමින් 1.2% ක් වූ රු.6,245,689 ක්ද දඩ හා ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර තිබුණි.

(vii) **වයඹ විශේෂ ව්‍යාපෘතිය අසාර්ථක වීම**

2006 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ 2010 දෙසැම්බර් 31 දිනට අය වීමට ඇති රු.මිලියන 3.3 ක් වූ ශේෂය අය කර ගැනිම ගැටලු සහගත තත්ත්වයක පැවතුණි. ව්‍යාපෘතිය තුළ සිදු වී ඇති මූල්‍යමය අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ආයතනය විසින් මෙතෙක් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 2.2.2 නිශ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවති මුළු පැය ගණන 50,220 ක් වූ අතර, එය අයවැයගත පැය ගණන වූ පැය 126,150 ට සාපේක්ෂව 40 % ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
මුළු නිශ්ක්‍රීය පැය ගණනින් පැය 37,139 ක් එනම් මුළු නිශ්ක්‍රීය කාලයෙන් 74% ක් වැඩ නොමැති වීම නිසාත් , පැය 5,502 (11% ) ක් යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම නිසාත් , පැය 4020 ( 8 % ) ක් යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිවීම ( No worker) නිසාත් උද්ගත වී තිබුණි.

(ii) 2010 වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිෂ්ක්‍රීය වූ යන්ත්‍ර 04 ක් හේතුවෙන් නිෂ්පාදනයට අහිමි වූ ඒකක ගණන 24,912,500 ක් ද,

ඇස්තමේන්තු කාලයෙන් 60% සිට 99% දක්වා කාලයක් නිෂ්ක්‍රීය වූ යන්ත්‍ර 08 ක් හේතුවෙන් නිෂ්පාදනයට අහිමි වූ ඒකක ගණන 48,168,232 ක් ද විය.

(iii) ලිතෝ අංශයෙහි ඇති Pacer 3 යන්ත්‍රය වැඩ නොමැති වීම නිසා නිෂ්ක්‍රීයව පවතින අතර, සංස්ථාව ආරම්භයේ සිටම මෙම යන්ත්‍රය පිළිසකර කිරීමට අපහසු තත්ත්වයේ පවතින බව සංස්ථාවේ සභාපතිවරයා 2011 මැයි මස 13 දිනැති ලිපියෙන් මා වෙත වාර්තා කරන ලදී.

### 2.2.3 හඳුනාගත් පාඩු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

( i ) නියමිත කාලසීමාව ඇතුලත සේවක භාරකාර අරමුදලේ දායක මුදල නොගෙවීම නිසා රු. 58,208 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

(ii) බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුපිරිවැටුම් බදු ප්‍රමාදවීම හේතුවෙන් රු.3,500ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

### 2.2.4 වාර්ෂික අයවැය ලේඛනය

---------------------------

අයවැය ගත හා තථ්‍ය ශේෂ අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛණය පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොමැති බව නිරීක්ෂණය කරනු ලැබේ.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයා වෙත වරින්වර දන්වා යවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) පාලන ගිණුම් සැසඳීම

(ඇ) අයවැය පාලනය

(ඈ) මුදල් පාලනය

(ඉ) තොග පාලනය